**වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පරිත්‍යාග වශයෙන් සභාවට නිකුත් කරන ලද මෝටර් රෝලරයේ වටිනාකම තක්සේරු කර පසුගිය වසර 02 ක කාල පරිච්ඡේදයක් තුළ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශනවල වාහනවල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | රෝලරයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | රෝලරයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර ඇත. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 126 iii (ඊ) වගන්තිය | ආදායම් පරීක්ෂකවරයා විසින් රු.170,550 ක් වටිනා අවසර නොලද ප්‍රමාණයන් 67 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | ගාස්තු අයකිරීමටත්, ඒවා ගෙවීම අපොහොසත් වුවහොත්, ප්‍රචාරක දැන්වීම් පුවරු ඉවත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 571 | රු.418,700 ක් වටිනා ලංසු ඇප තැන්පතු සහ කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ගෙවිය යුතු ඇප මුදල් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නියමිත රීතින්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ආපසු ගෙවීමට ලිපි යවා ඇත. |
| (ඈ) | උතුරු පළාත් මූල්‍ය චක්‍රලේඛය | | | |
| | 2017 මාර්තු 07 දිනැති PE/01/2017 දරන චක්‍රලේඛය | මුදල් හෝ ගබඩා භාණ්ඩ ලැබීමට හෝ ඒවා භාරයේ තබා ගැනීමට පරිපාලන වශයෙන් වගකිව යුතු හෝ අධිකාරී බලය පැවරීමෙන් අදාල වගකීම් පවරා ඇති නිලධාරීන් 30 දෙනෙකු විසින් ඇප මුදල් ගෙවා තිබුණත් චක්‍රලේඛ අනුව හිඟ මුදල් ලබාගෙන නොතිබුණි. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඇප මුදල් අයකිරීමට කටයුතු කරමින් පවතී. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.69,101,854 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 104,354,496 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 14,118,700 | - | 14,936,876 | 20,698,175 | 14,028,700 | - | 15,105,496 | 17,254,351 |
| කුලී | 43,696,800 | - | 42,860,188 | 2,329,771 | 41,083,800 | - | 41,137,004 | 2,354,221 |
| බලපත්‍ර ගාස්තු | 4,978,000 | - | 2,896,341 | - | 6,293,000 | - | 8,305,231 | 21,250 |
| වෙනත් ආදායම් | 94,606,854 | - | 85,319,492 | 18,431,747 | 92,961,400 | - | 114,204,152 | 119,212,828 |
| එකතුව | 157,400,354 | - | 146,012,897 | 41,459,693 | 154,366,900 | - | 178,751,883 | 138,842,650 |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු.178,751,883 ක් වුවත් 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.146,012,897 ක් දක්වා අඩුවීමෙන් 2017 වර්ෂයේ ආදායම 2018 හා සැසඳීමේදී ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.32,738,986 කින් අඩු වී තිබුණි. එසේ වුවත්, බිල්කළ ආදායම තහවුරු කළ නොහැකි විය. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සභාවේ හිඟ වරිපනම් බදු එකතුව රු.17,227,392 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් සියල්ල අයකර ගත යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කෙරේ. |

**2.2.4 කුලී**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ හිඟ කඩ කුලී රු.92,090 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සියළු හිඟ මුදල් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | කුලී සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ග ගෙන ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ හිඟ බදු කුලී රු.2,120,526 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් හිඟ බදු කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | බදුකරුවන්ට විරුද්ධව සිවිල් නඩු පවරා ඇත. |

**2.2.5 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

**උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.5,295,521 ක් සහ මුද්දර ගාස්තු රු.18,431,747 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු සියල්ල අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලු කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ

සුබවිහරණය, පහසුකම් සහ සුහසාධනය සහ ආරක්‍ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවු කරණු පහත සඳහන් පරිදි විය.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් 30ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සියළුම ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | මින් ඉදිරියේදී සියළුම මූලධන වැඩසටහන් සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කරනු ලැබේ. |

(ආ) මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සකස් කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව පැවති ක්‍රියාකාරකම් 34 කින් ක්‍රියාකාරකම් 31 ක් පමණක් වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා තිබූ බැවින් රු.6,325,000 ක් වටිනා ක්‍රියාකාරකම් 03 ක් ක්‍රියාත්මක කළ නොහැකි විය. | ඇස්තමේන්තුව ප්‍රකාරව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ සංවර්ධනය මූල්‍ය ප්‍රතිපාදන යටතේ ප්‍රතිපාදන සලසා ඇත. |

(ඇ) කාර්යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආරම්භ කිරීමට නියමිත දිනයේ කාර්යයන් ආරම්භ කර නොතිබූ බැවින් ගිවිසුම් කාලය ඉකුත් වී මාස 04 – 07 ක් ප්‍රමාද වී තිබුණත් අදාළ ක්‍රියාකාරකම් අවසන් කර නොතිබුණි. | ක්‍රියාකාරකම් නියමිත කාලයේ අවසන් කිරීමට කටයුතු කළ යුතුවේ. | කාර්යයන් අවසන් කර දීමට කොන්ත්‍රාත් කරුවන්ට උපදෙස් ලබාදී ඇත. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු දිගුකාලීන හා කෙටිකාලීන ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේ රු.2,709,810 ක් වැය කර තිබුණි. එසේම ආදායම් ලෙස රු.2,137,647 ක් සභාව විසින් උපයාගෙන තිබුණි. | ජාතික ප්‍රතිපත්ති අනුව ක්‍රියාමාර්ග ගත යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස රු.2,709,810 ක් වැය කර තිබුණත් ආදායම් ලෙස රු.2,137,647 ක් උපයාගෙන තිබුණි. |
| (ii) | ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේදී ආවරණය කළ වාහන භාවිතා නොකර විවෘත වාහනවලින් කසළ රැස්කරන බැවින් මාර්ගවල ගමන් කරන ජනතාවට සෞඛ්‍ය සම්බන්ධ ගැටළු ඇති වී තිබූ අතර ප්‍රමාණයට අධිකව කසළ ප්‍රවාහනය කිරීම නිසා කසළ මාර්ගය පුරා වැටී තිබුණි. | අපද්‍රව්‍ය රැස්කිරීමේදී පරිසරයට බලපෑම් සිදු නොවන පරිදි ආවරණය කළ වාහන භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | ආවරණය කළ වාහන භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (iii) | ඝන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් පවත්වා නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණයන් සිදු කළ බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ප්‍රතිශක්තීකරණ බෙහෙත් සෑම වර්ෂයකම සෞඛ්‍ය කම්කරුවන්ට ලබාදෙනු ලැබේ. |

**(ඉ) පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මැසිතෙල් ඉසීම සහ මදුරු බෝවීමත්, දුර්ගන්ධය ඇති වීම වැලැක්වීමටත් කටයුතු කළ යුතු වේ. | මදුරුවන් බෝවීම වැලැක්වීමට කිසිදු මෙවලමක් නිර්දේශ කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | බන්ධනාගාර ප්‍රතිසංස්කරණය පුනරුත්ථාපනය සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශ අරමුදල් යොදා ගනිමින් යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් චුන්නාකම් කොන්තියාලාඩි ප්‍රදේශයේ2016 සැප්තැම්බර් 08 දින ආරම්භ කළ අපවිත්‍ර ද්‍රව්‍ය බස්නා කාණු සැකසුමේ මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු නිම නොකර2018 මාර්තු 13 දින අත්හිටුවා තිබුණි. කෙසේවුවද මේ දක්වාම අපවිත්‍ර ද්‍රව්‍ය බස්නා කාණු සැකසුම් මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු අවසන් නොකළ නිසා සභා බල ප්‍රදේශය තුළ අපවිත්‍ර ජල බස්නා කාණු සැකසුම් කටයුතු සිදුකළ නොහැකිව තිබුණි. | මල අපද්‍රව්‍ය පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම් කාර්යයන් අවසන් කර සභාවේ බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුය. | මල අපද්‍රව්‍ය පිරිපහදු මධ්‍යස්ථාන ඉදිකිරීම් කාර්යයන් අවසන් නොවූ බැවින් භාර දී නොතිබුණි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන සහකාර විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් නොකිරීමෙන් ප්‍රදේශයට අදාල මූලික කාර්යයන් ඉටු කර නොතිබුණි. | නියමිත වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) | නගර සභාව මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයකින් පසුව සිදු කර තිබුණි. | සභාව විසින් ජනතාවට සැලසිය යුතු සේවාවන් නියමිත කාලයේ සැලසිය යුතු වේ. | මහජන සේවා ලැයිස්තුව හඳුන්වා දීමට කටයුතු කෙරේ. |
| (ඇ) | 2018 වර්ෂයේ රු. 600,000ක් වටිනා ලබාදුන් කොන්ත්‍රාත් අත්තිකාරම් සභාව විසින් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් සභාව විසින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | පලාත් පාලන අමාත්‍යාංශයේ විමර්ශණ වාර්තා ලැබූ වහාම අත්තිකාරම් නිරවුල් කරනු ලැබේ. |
| (ඈ) | ප්‍රාදේශීය සභාවට අයත් වපසරිය 32කින් යුත් ඉඩමේ අනවසර අන්දමින් ජනතාව පදිංචිවී තිබුණි.මෙම පදිංචි වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනවසර පදිංචි වීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුවේ. | අනවසර පදිංචි වීම් සම්බන්ධයෙන් නඩු විභාග වෙමින් පවතී. |

| | | |
|---|---|---|
| (ඉ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු රු.207,997,141 ක් වටිනා අරමුදල් ස්ථාවර තැන්පතුව සංවර්ධන වැඩසටහන් සඳහා උපයෝජනය නොකර බැංකුවේ පොළී ඉපැයීමේ අරමුණින් තැන්පත් කර තිබුණි. | ස්ථාවර තැන්පතු ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා උපයෝජනය කළ යුතු වේ. | ස්ථාවර තැන්පතුවල පොලී ආදායම් සභාවේ සංවර්ධන කාර්යයන් සඳහා උපයෝජනය කෙරේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 17 ක් විසින් ඉටු කළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සභා බල ප්‍රදේශයට අයත් ඉඩම් සහ ඉදිකළ නිවාස, ගොඩනැගිලිවලින් වරිපනම් බදු අයකිරීමට වාර්ෂිකව සභාව විසින් දේපල හිමියන්ට K ආකෘති පත්‍ර ලබාදිය යුතු වුවත්, 2018 වර්ෂයේ දේපල රු.24,669 ක් සඳහා "K" ආකෘති පත්‍ර නිකුත් කර නොතිබුණි. | වරිපනම් බදු අයකිරීම සඳහා වාර්ෂිකව K ආකෘති පත්‍ර ලබාදිය යුතු වේ. | ඉදිරියේදී මෙම දෝෂ නිවැරදි කරනු ලැබේ. |
| (ආ) කල් උන්ඩායි සන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් සභාවට එරෙහිව අංක AR/175/15 දරන නඩුව විභාග වෙමින් පැවතුණද මේ සඳහා වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි. | ඉදිරියේදී මෙම දෝෂ නිවැරදි කරනු ලැබේ. |
| (ඇ) 2000 අප්‍රේල් 05 දින සභාව විසින් රු.3,242,600 කට මිලදී ගත් වලිනුන්ගෙයි ඉඩමේ අයිතිය පිළිබඳව මල්ලාකම් දිස්ත්‍රික් උසාවියේ 2002 දෙසැම්බර් 05 දින අංක එල්/168 දරන නඩුව විභාග වෙමින් පැවතීම නිරීක්ෂණය වූ අතර මේ සඳහා වියදම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි. | වලිනුංගෙයි ඉඩම් නඩුව අවසන් නොවූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ භාවිතයේ පවතින වාහන 07 ක අයිතිය මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | වාහනවල අයිතිය මාරු කිරිම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

### 3.5.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වුන්නාගම් උප කාර්යාලයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී පොත් 25 ක් භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | භෞතික පරීක්ෂාවට ඉදිරිපත් නොකළ පොත් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

## 3.6 ප්‍රසම්පාදනය

### ප්‍රසම්පාදන සැලැස්ම

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රතිමිලදී ගැනුම් ඇණවුම් ක්‍රියාත්මක කර නොතිබුණි. | නැවත ප්‍රසම්පාදන ප්‍රතිමිලදී ගැනුම් ඇණවුම් ක්‍රියාත්මක කළ යුතුය. | ඉදිරියේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 ප්‍රකාරව ප්‍රතිමිලදී ගැනුම් ඇණවුම් ක්‍රියාත්මක කරනු ලැබේ. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන විනය ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රසම්පාදන විනය ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කළ යුතු වේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන විනය ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කරනු ලැබේ. |
| (ඇ) | කොන්ත්‍රාත්කරුගෙන් කාර්යසාධන ඇපකර ලබාගෙන නොතිබුණි. | කාර්යසාධන ඇපකර ලබා ගත යුතුවේ. | කාර්යසාධන ඇපකර ඉදිරියේදි ලබා ගැනීමට කටයුතු කෙරේ. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සභාවේ අයවැය ඇස්තමේන්තුවේ පුනරාවර්තන වියදම් සහ තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී රු.18,376,151 කින් හිතකරව පැවතුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |